සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2023 ජනවාරි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2023-02-25
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් නීති අතුරෙන්, ශ්‍රී ලංකාවේ අවශේෂ නීතිය (residual law) වශයෙන් ක්‍රියාත්මක වන්නේ කුමක් ද?

(1) උඩරට නීතිය. (2) රෝම ලන්දේසි නීතිය.
(3) ඉංග්‍රීසි නීතිය. (4) මුස්ලිම් නීතිය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, මහාධිකරණයේ බලතලයක් **නොවන්නේ** කුමක් ද?

(1) මූලික අධිකරණ බලය. (2) අභියාචනාධිකරණ බලය.
(3) බුදල් නඩු. (4) බේරුම්කරණ නඩු.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, ගනුදෙනු කළ හැකි ලියවිල්ලක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) පැවරුම්ලාභියාට තමා නමින්ම නඩු පැවරිය හැකිවීම.
(2) පවරන්නාගේ හිමිකමෙහි දෝෂ පවතින විට පැවරුම්ලාභියාට ද දෝෂ සහගත හිමිකමක් ලැබීම.
(3) බාරදීමෙන් හෝ පිටසන්කර භාරදීමෙන් ලියවිල්ලේ අයිතිය පැවරිය හැකි වීම.
(4) ලියවිල්ලක් පැවරීමකදී, ගෙවීමට වගකීමක් ඇති තැනැත්තාට පැවරීම දැනුම්දීම අවශ්‍ය නොවීම.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, CIF ගිවිසුමකට අනුව විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත ලබාදිය යුතු ලියවිල්ලක් වන්නේ කුමක් ද?

(1) රක්ෂණ සහතිකය. (2) නෞභාර පත්‍රය.

(3) ඉන්වොයිසිය. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.5** පහත සඳහන් පිටසන (endorsement) සලකා බලන්න:

> **ටෝනි ප්‍රනාන්දුට පමණක් ගෙවන්න**
>
> **එස්. සීතාදේවි**

ඉහත දක්වා ඇති පිටසන හඳුන්වනු ලබන්නේ:

(1) විශේෂ පිටසනක් ලෙසයි. (2) සීමාකාරී පිටසනක් ලෙසයි.

(3) හිස් පිටසනක් ලෙසයි. (4) කොන්දේසි සහිත පිටසනක් ලෙසයි.

**1.6** භාණ්ඩ විකිණීමේ ආඥා පනත අනුව, නියැදියකට අනුව භාණ්ඩ විකුණා ඇති විටෙක;

**(a)** ගැනුම්කරුට මුළු තොගය, නියැදිය සමඟ සැසඳීම සඳහා සාධාරණ අවස්ථාවක් තිබිය යුතුය.

**(b)** නියැදියේ තිබුණා වූ දෝෂ හැර වෙනත් දෝෂ කිසිවක් මුළු තොගයේ නොතිබිය යුතුය.

**(c)** සමස්තයක් වශයෙන් සලකා බලන කළ මුළු තොගයම නියැදියට අනුකූල විය යුතුය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ නියැදියට අනුකූල විය යුතුයැයි දැක්වෙන ව්‍යංග කොන්දේසියට අනුව නිවැරදි ප්‍රකාශ වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a)** සහ **(c)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක 1.7 සිට 1.9 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.7** ඒකකභාරයක භාරකරුගේ ක්‍රියාකාරකම් පිළිබඳව විමසීම සහ විභාග කිරීම, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යභාරයන්ගෙන් එකකි.

**1.8** නියම කරන ලද ලියවිලි අපනයනකරු වෙත බාරදුන් පසු ගෙවීම් කිරීමට එකඟවන කොන්දේසියක් ලෙස ණයවර ලිපිය හඳුන්වාදිය හැකිය.

**1.9** චෙක්පතක, "අණකරු" වන්නේ එම චෙක්පත ලියන ලද බැංකුව වේ.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.10 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.10** මුදල් විශුද්ධිකරණය යටතේ වන එකඟවීමේ විත්තිවාචකය (consent defence) යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.11** නෞභාර පත්‍රයේ ඇති වැදගත්කම් දෙකක්(02) සඳහන් කරන්න.

**1.12** චෙක්පතකට යොදනු ලබන රේඛණ වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

**1.13** භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අනුව, ගැනුම්කරුවෙකු හට ඇති ප්‍රතිකර්ම දෙකක්(02) සඳහන් කරන්න.

**1.14** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ හැකි සමාගම් වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)
(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

2022 ජනවාරි මාසයේදී **තිමල්** විසින් එකඟ වූ මිල, මාසික වාරික 60 කින් ගෙවිය යුතු කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ **ශ්‍රී-ලක් එන්ටර්ප්‍රයිසස්** ආයතනයෙන් මෝටර් රථයක් මිලට ගන්නා ලදී. 2022 සැප්තැම්බර් මාසයේදී මෝටර් රථය අනතුරකට ලක්වූ අතර, **තිමල්** ට ඔහුගේ රැකියාවට යාම සඳහා විකල්ප ප්‍රවාහන සේවාවක් භාවිත කිරීමට සිදුවිය. එමනිසා, **තිමල්** විසින් ගිවිසගත් පරිදි මාස 06 ක වාරික නොගෙව්වේය. **ශ්‍රී-ලක් එන්ටර්ප්‍රයිසස්** ආයතනය මෙම මෝටර් රථය සිය භාරයට ගැනීමට උනන්දු වූ අතර, මෙම රථය ආපසු රැගෙන ඒම සඳහා පුද්ගලයින් දෙදෙනෙකු යොදවන ලදි. මේ අතරතුර, මෝටර් රථවල මිල සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති බැවින් **තිමල්** විසින් මෙම මෝටර් රථය තුන්වන පාර්ශවයකට විකිණීමට උත්සහ දරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මේ සම්බන්ධයෙන් **තිමල්** සතු නෛතික අයිතිවාසිකම් (duties) සහ යුතුකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) **ශ්‍රී-ලක් එන්ටර්ප්‍රයිසස්** ආයතනය සතු නෛතික අයිතිවාසිකම් සහ වගකීම් (obligations) **පැහැදිලි කරන්න**.

(ලකුණු 05)
(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

නියෝජ්‍යත්ව නීතිය මඟින් ව්‍යංග ක්‍රම ඔස්සේ නිර්මාණය වන විවිධ වූ නියෝජ්‍යත්වයන් හඳුනා ගනී. ප්‍රධානියා සහ නියෝජිතයා අතර නියෝජ්‍යත්වය ඇතිවන එක් ආකාරයක් වන්නේ අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය ඇතිවීම වේ. නියෝජිතයා විසින් සිය ප්‍රධානියා පවරන ලද වගකීමට පටහැනිව කටයුතු කර ඇත්නම්, ප්‍රධානියා එම ක්‍රියාවෙන් වගකීමට නොබැඳේ. නමුත්, එම ක්‍රියාව ප්‍රධානියා විසින් පසුව අනුමතකොට අපරානුමැතියෙන් නීතිමය අවසරය ලබාදිය හැකිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අපරානුමැතියට අදාල රීති දෙකක්(02) එකිනෙකට සුදුසු උදාහරණයක්ද සමඟ **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය ඇතිවීම සඳහා සම්පූර්ණ විය යුතු කරුණු හතරක්(04) **සඳහන් කරන්න**.

(ලකුණු 04)
(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

ක්‍රිකට් ක්‍රීඩකයන් සඳහා ක්‍රීඩා භාණ්ඩ විකිණීම පිණිස **අසාර්** සහ **අමීර්** එක්ව **A සහ A** නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඔවුන් දෙදෙනා එක්ව මෙම ව්‍යාපාරයේ දියුණුව පිණිස කටයුතු කළ අතර, මෙම ව්‍යාපාරය මූලිකවම ඉන්දියාවෙන් අදාල ක්‍රිකට් භාණ්ඩ ආනයනය කරන ලදී. කෙසේවෙනත්, **අමීර්** විසින් ඉන්දියාවේ **සීමාසහිත Bat-Man සමාගමෙන්** වට්ටම් මිලකට ක්‍රීඩා භාණ්ඩ මිලටගෙන ඒවා පවතින වෙළෙඳපොළ මිලට **A සහ A** ව්‍යාපාරයට අලෙවිකොට ඇති අතර, එය ඔහු ලබාගත් මිලට වඩා 40% ක් වැඩි බව **අසාර්** විසින් සොයාගන්නා ලදී. මෙම ගනුදෙනුවෙන් **අමීර්** රහස් ලාභයක් උපයාගත් අතර, එය **අසාර්** සමඟ බෙදා නොගන්නා ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල්කරුවෙකු වශයෙන් **අමීර්** විසින් කඩකළ යුතුකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) මේ සම්බන්ධයෙන් **අසාර්** සතුව ඇති නෛතික අයිතිවාසිකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) අධිකරණ නියෝගයක් මගින් හවුල් ව්‍යාපාරයක් විසිරවනු ලබන අවස්ථා දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

පාරිභෝගිකයින් විසින් එය කරනු ලබන ගනුදෙනුව එය සිදුකරන ක්‍රමය නොසලකා ඔවුන්ව ආරක්ෂා කිරීම සඳහා විවිධ රෙගුලාසි හඳුන්වා දී ඇත. 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ සඳහන් නීති සහ රෙගුලාසි මගින් ශ්‍රී ලාංකීය පාරිභෝගිකයන් ආරක්ෂා කරනු ලබයි. 2007 අංක 24 දරණ පරිඝණක අපරාධ පනත ද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වැදගත් පනතක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ පිහිටුවා ඇති පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) පරිඝණක අපරාධ පනතේ අරමුණ **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(c) පරිඝණක අපරාධ පනතින් ආවරණය වන වැරදි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**දර්ශි** සඳුදා දින **යසෝගෙන්** සීනි කිලෝග්‍රෑම් 1,000 ක් මිලදී ගන්නාය. **යසෝ** විසින් එම සීනි තොගය බෙදාහැරීම සඳහා සූදානම් වනවිට, **දර්ශි** විසින් එම තොගය රැගෙන යනතෙක් **යසෝගේ** ගබඩාවේ තබාගන්නා ලෙස **දර්ශිගෙන්** ඉල්ලා සිටින ලදී. අඟහරුවාදා රාත්‍රියේ ඇතිවූ කුණාටු තත්ත්වය හේතුවෙන් **යසෝගේ** ගබඩාව ගංවතුරෙන් යටවූ අතර, සීනි තොගයට ගංවතුරෙන් හානි සිදුවිය. එමනිසා **දර්ශි** විසින් එම සීනි තොගය ලබාගැනීම ප්‍රතික්ෂේප කොට මුදල් ආපසු ලබාදෙන ලෙස දන්වන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ **දර්ශි** සහ **යසෝ** සතු නෛතික අයිතිවාසිකම් **විමසන්න**. (ලකුණු 06)

(b) මිල නොලත් විකුණුම්කරු හට එම භාණ්ඩ නැවත විකිණිය හැකි (re-sale) අවස්ථාවන් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

(A) මෑතකදී නීතිඥ වෘත්තියෙන් විශ්‍රාම ගත් **ගිතිකත මහතා** කොළඹ ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වන අතර, ඔහු මොණරාගල පිහිටි දුරස්ථ ප්‍රදේශයකට යාමට තීරණය කරන ලදී. ඒ අනුව, 2023 අවසානය වනවිට **ගිතිකත මහතා** තම මෙම නව වාසස්ථානයට යාමට නියමිත හෙයින් ඔහු සතු වසර පහක් පැරණි බෙන්ස් වර්ගයේ කාර් රථය තවදුරටත් අවශ්‍ය නොවනු ඇත. ඔහු විසින් 2022 දෙසැම්බර් 11 වන ඉරිදා දින උසාවි සංකීර්ණයේ ඇති දැන්වීම් පුවරුවේ දැන්වීමක් පළකරන ලදී.

> **විකිණීමට**
>
> **අනර්ඝ තත්ත්වයේ බෙන්ස්-1948 කාර් රථය රු. මිලියන 3 කට මිලදී ගැනීමට කැමති බව පහත ලිපිනයට ලිඛිතව දැනුම්දෙන පළමු පුද්ගලයාට විකුණනු ලැබේ.**
>
> 666, **අළුත්කඩේ, කොළඹ**-12.

12 වන සඳුදා උදෑසන, **ගිතිකත මහතා** විසින් අලුතින් පත්වීම් ලැබූ නීතිඥවරියක් වන **කල්පනා මෙනෙවියට** දුරකතනයෙන් අමතා ඔහුගේ කාර් රථය දැන්වීමේ සඳහන් තොරතුරු පරිදි මිලදී ගැනීමට අර්පණය කරන ලදී. එදිනම ඇය විසින් එම මෝටර් රථය, ඊළඟ 16 වන සිකුරාදා උදේ මිලට ගැනීමට අවශ්‍ය බව දන්වමින් **ගිතිකත මහතාට** ලිපියක් යවන ලදී. මෙම ලිපිය කොළඹ-12 ලිපිනයට 14 වන බදාදා දින ලැබී තිබුණි.

12 වන සඳුදා උදෑසන **ගිතිකත මහතාගේ** කණිෂ්ඨ නීතිඥවරිය වන **පොඩිමැණිකේ මෙනෙවිය** දැන්වීම් පුවරුවේ සඳහන් දැන්වීම දුටු අතර, එදිනම **ගිතිකත මහතාට** තැපැල් පතක් යොමු කරමින් මෙම රථය සඳහා රු. මිලියන 3 ක් ගෙවීමට කැමැත්ත ප්‍රකාශ කරන ලදී. 13 අඟහරුවාදා දින මෙම තැපැල්පත **ගිතිකත මහතාට** ලැබී තිබුණි.

13 වන අඟහරුවාදා රාත්‍රියේදී **ගිතිකත මහතා** විසින් **විල්ෆඩ් මහතා** සමඟ රාත්‍රී ආහාරය ලබාගත් අතර, එහිදී **ගිතිකත මහතා** විසින් ඔහුගේ කාර් රථය **විල්ෆඩ් මහතාට** රු. මිලියන 2.5 කට විකිණීමට පොරොන්දු විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **කල්පනා මෙනෙවිය** සහ **ගිතිකත මහතා** අතර, වලංගු ගිවිසුමක් පවතිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) **පොඩිමැණිකේ මෙනෙවිය** සහ **ගිතිකත මහතා** අතර, වලංගු ගිවිසුමක් පවතිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(c) **විල්ෆඩ් මහතා** සතු නෛතික අයිතිවාසිකම් (legal rights) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(B) පාරිභෝගිකයින් විසින් **සීමාසහිත පුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමට** කරනු ලබන මෝටර් රථ රක්ෂණ හිමිකම් සම්බන්ධ පරික්ෂණ, තක්සේරු කිරීම් සහ විමර්ශන සිදුකිරීමට සුදුසු බව පෙනී ගිය හෙයින් **සුරක්ෂා** නම් කාන්තා යාන්ත්‍රික ඉංජිනේරුවරියක මෝටර් රථ තක්සේරුවරියක් වශයෙන් **සීමාසහිත පුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමට** බඳවාගෙන ඇත. 2020 ජූනි 01 දින **සුරක්ෂා, සීමාසහිත පුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමට** සම්බන්ධ වී ඇත. පාර්ශව අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව, **සුරක්ෂා, සීමාසහිත පුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමේ** යහපත වෙනුවෙන් වැඩ කිරීමට බැඳී සිටී. ඇය එසේ කිරීමට අසමත් වුවහොත් ඇයව සේවයෙන් පහ කිරීමට සමාගමට හැකියාව ඇත. **සුරක්ෂා** විසින් සෑම දිනම උදෑසන 9.30 ට පෙර සේවයට වාර්තා කළ යුතුය. **සීමාසහිත පුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගම** විසින් තක්සේරුකරුවන්ට අවශ්‍ය සියලුම උපකරණ ලබාදී ඇති අතර, ප්‍රවාහන සහ අදාල තක්සේරු වියදම් ප්‍රතිපූරණය කරනු ලබයි.

වසර දෙකකට පසුව, එනම් 2022 ජූනි 18 දින, **සීමාසහිත පුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගම** විසින් **සුරක්ෂා** ව සේවයෙන් පහකරන ලදී. මෙහිදී **සුරක්ෂා** විසින් ඇය සමාගමේ සේවකයෙකු ලෙස තර්ක කරන ලදී. සමාගම විසින් ඇය ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු ලෙස හඳුන්වන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අදාල පරික්ෂණයන්ට දක්වමින්, සේවකයා සහ ස්වාධීන කොන්ත්‍රාත්කරු අතර වෙනස **පැහැදිලි කරන්න**.
(ලකුණු 05)

(b) **සීමාසහිත පුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමට** එරෙහිව **සුරක්ෂා** ට සේවකයෙකු ලෙස ඇයගේ තනතුර ඉල්ලා සිටිය හැකිද යන්න **විමසන්න.** (ලකුණු 05)
(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |